016

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනපති උපාධි පාඨමාලාව

අවසාන පරීක්ෂණය - 2009

ESP 2317 - ගුරු අධ්‍යාපනය

කාලය - පැය තුනයි.

---

දිනය - 2009 පෙබරවාරි 13 වේලාව - පෙ.ව.09.30 - ප.ව. 12.30

---

ප්‍රශ්න තුනකට පමණක් (03) පිළිතුරු සපයන්න.

01. (i) 'ගුරු අධ්‍යාපනය' යන යෙදුම නිර්වචනය කරන්න. (ලකුණු 06)

(ii) (අ) ආරම්භක වෘත්තිය ගුරු අධ්‍යාපනය
හා
(ආ) අඛණ්ඩ වෘත්තිය ගුරු අධ්‍යාපනය
සුදුසු උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iii) ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපන වැඩසටහන්වල ගුණාත්මකභාවය හා කාර්යක්ෂමතාව කෙරෙහි බලපාන සාධක තුනක් විවේචනාත්මකව විභාග කරන්න. (ලකුණු 15)

02. 'ගුරුවරයාගේ වෘත්තියභාවය නිපුණතා, කාර්ය සාධනය හා කල්ක්‍රියාව යන ගති ලක්ෂණ තුනෙන් සමන්විත වේ.

(i) 'ගුරු වෘත්තියභාවය' යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 06)

(ii) ගුරුවරයාගේ වෘත්තියභාවයට ඇතුළත් විය යුතු ඉහත දැක්වූ ගති ලක්ෂණ තුන අදාළ උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iii) ඉහත ගති ලක්ෂණ ගුරුවරුන් තුල සංවර්ධනය කිරීමෙහි ලා ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපන ආයතන හා පාසල් පද්ධතිය ඉටු කරන භූමිකා සාකච්ජා කරන්න. (ලකුණු 15)

03. 'ශ්‍රී ලංකාව තුල වර්තමානයේ දී ක්‍රියාත්මක වන ගුරු ස්ථාපනය හා ගුරු මාරුවීම් පිළිබඳ ප්‍රතිපත්ති පාසල්වල කාර්යක්ෂමතාව කෙරෙහි ධනාත්මකව මෙන්ම සෘණාත්මකව ද බලපා ඇත.'

(i) ගුරු ස්ථාපනය හා ගුරු මාරුවීම් සම්බන්ධයෙන් දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රතිපත්තීන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී මතු වී ඇති ගැටළු සාකච්ජා කරන්න. (ලකුණු 10)

(iii) ඔබ හඳුනාගත් ගැටළු අවම කර ගැනීම උදෙසා ක්‍රමෝපායන් යෝජනා කරන්න. (ලකුණු 13)

04. 'ගුරුවරුන් සඳහා 'ආචාර ධර්ම මාලාවක් ' සංවර්ධනය කිරීමෙන් අපේක්ෂා කරනුයේ වෘත්තිය විශිෂ්ඨත්වය උත්පාදනය කිරීම හා ගුරුවරුන්ගේ කල්ක්‍රියාව මෙහෙයවීමයි.'

(i) ශ්‍රී ලංකාවේ ගුරුවරුන් උදෙසා 'ආචාර ධර්ම මාලාවක්' හඳුන්වාදීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.
(ලකුණු 08)

(ii) ගුරුවරුන්ගේ වෘත්තිය විශිෂ්ඨත්වය උත්පාදනය කිරීම හා යහපත් කල්ක්‍රියාව මෙහෙයවීම උදෙසා ආචාර ධර්ම මාලාවක් සංවර්ධනය කිරීමේ දී අවධානයට ගත යුතු අංශ පහක් කෙටියෙන් දක්වන්න.
(ලකුණු 10)

(iii) ඒවා අතුරින් අංශ තුනක් තෝරාගෙන එක් එක් අංශ පැහැදිලි කරන්න.
(ලකුණු 15)

05. (i) 'ගුරු සවිබලකරණය' යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 10)

(ii) තම අධ්‍යාපනික කාර්යයන් ඵලදායි ලෙස ඉටු කිරීමට හැකිවන පරිදි ශ්‍රී ලංකාවේ ගුරුවරුන් කෙතරම් ප්‍රමාණයකට සවිබලකරණය වී තිබේද යන්න පැහැදිලි කරන්න. අදාළ පරිදි නිදසුන් දක්වන්න.
(ලකුණු 10)

(iii) ශ්‍රී ලංකාවේ ගුරුවරුන් සවිබලකරණය සඳහා ගුරු අධ්‍යාපන වැඩ සටහන් මගින් දැක්විය හැකි දායකත්වය විභාග කරන්න.
(ලකුණු 13)

06. පහත දැක්වෙන මාතෘකා තුනක් පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

(i) ශ්‍රී ලංකාවේ විවිධ ආයතන මගින් පවත්වා ගෙන යනු ලබන ගුරු අධ්‍යාපන වැඩසටහන්වල ගුණාත්මකභාවය සහතික කිරීමේ හා ප්‍රමිතිකරණයේ අවශ්‍යතාව

(ii) ශ්‍රී ලංකාවේ ගුරු සංවර්ධනය උදෙසා පාසල් ක්ෂේත්‍රය පාදක කරගත් සහායක සේවාවක් හඳුන්වාදීමේ අවශ්‍යතාව

(iii) වර්ෂ 1995 දී 'ශ්‍රී ලංකාවේ ගුරු සේවාව' (SLTS) පිහිටුවීමේ වැදගත්කම

(iv) ගුරුවරුන් සඳහා කාර්ය සාධන තක්සේරුකරණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව

- හිමිකම් ඇවිරිණි. -